# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2396/57 – 2024 අගෝස්තු මස 09 වැනි සිකුරාදා – 2024.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/296.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එච්.කේ.ඩී.එස්. තිලකරත්න මහතා, අංක 51/10, කොළඹ පාර, අවිස්සාවේල්ල.

සහ

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ.එච්.කුරේ ගොඩනැගිල්ල, 411, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තේගොඩ මදාරා උයන, අංක 149/102 කේ.කේ.ධනපාල මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2019/296.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. කේ.ඩී.එස්. තිලකරත්න මහතා, අංක 51/10, කොළඹ පාර, අවිස්සාවේල්ල.

සහ

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ.එච්.කුරේ ගොඩනැගිල්ල, 411, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්හි කැලණිය ශාඛා කාර්යාලයේ, ශාඛා ගිණුම් සහකාරවරයෙකු ලෙස සේවය කරන එච්.ඩී.එස්.තිලකරත්න මහතාට සමාගම් කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ තීරණයක් මත 2005 වර්ෂයේදී ගෙවනු ලැබූ වැටුප් වර්ධක 05 සඳහා හිමිකමක් තිබේද එසේ හිමිකමක් තිබේ නම් එය ලබා නොදීම මගින් ඒ මහතාට අසාධාරණයක් සිදුවී ඇත්ද යන්නනත්, එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ලැබිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 0104

---

මගේ අංකය: IR/COM/03/2023/107.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ජී.ඩී.ජේ.සමාධි අමරතුංග මහතා, අංක 85/1, කෙසෙල්වතුගොඩ, යක්කල.

සහ

ලංකා ටයර් රිට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 159, ගාලු පාර, සරික්කමුල්ල, මොරටුව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, කච්චේරිය පාර, අංක 24/9, ආචාර්ය කේ.ඒ.එස්.කීරගල මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2023/107.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජී.ඩී.ජේ.සමාධි අමරතුංග මහතා, අංක 85/1, කෙසෙල්වතුගොඩ, යක්කල.

සහ

ලංකා ටයර් රිට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 159, ගාලු පාර, සරික්කමුල්ල, මොරටුව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ලංකා ටයර් රිට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි සේවය කරනු ලැබූ ජී.ඩී.ජේ.සමාධි අමරතුංග මහතා විසින් සඳහන් කර ඇති පරිදි 2018.09.01 සිට 2019.12.13 දක්වා කාලසීමාව සඳහා ගෙවා නොමැති අතිරේක දීමනාව සඳහා ඔහුට හිමිකමක් තිබේද යන්නත්, එසේ හිමිකමක් තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ. ''

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 - 0124

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.